## IV. පෞද්ගලික

බැංකු අධිපතිවර ඩී. ඩබ්ලිව්. රාජපතිරාන මහතා ඉන්දියානු මහ බැංකු අධිපතිගේ ඇරයුමෙක් පිළිගෙන බොම්බායේ දී ''සියැංසා'' සංවිධානය යටතේ පුහුණුවන්නන් අමතා කථාවක් පැවැත්වීමට 1960 මාර්තු 12 වැනි දින ඉන්දියාව බලා පිටත් විය. අධිපතිවරයා නැවත ලංකාවට පැමිණියේ, 1960 මාර්තු 14 වැනිදය. ඉන්පසු, පොදු රාජ්‍ය මණ්ඩලීය මහ බැංකු අධිපතිවරුන්ගේ සම්මේලනයට සහභාගි වනු වස් 1960 මැයි 28 වැනි දින ලංඩනය බලා ගිය අධිපතිවරයා, 1960 ජූනි 8 වැනි දින පෙරළා ලංකාවට සැපත් විය. ගරු අගමැතිවරියගේ ඇරැයුම පරිදි, 1960 සැප්තැම්බර් 17 වැනිද හා 1960 දෙසැම්බර් 4 වැනිද කාලය අතරතුර ලංකාවේ නියෝජිතයකු වශයෙන් නිව්යෝක්හි එක්සත් ජාතීන්ගේ සංගමයෙහි 15 වැනි සැසි වාරයට ද, ලංකාව වෙනුවෙන් පෙනී සිටින විකල්ප අධිපති වශයෙන්, වොෂින්ටන්හි, ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ ද, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ ද ජාත්‍යන්තර මුදල් සමායතනයේ ද අධිපති මණ්ඩලයන්හි වාර්ෂික රැස්වීම්වලට ද අධිපතිවරයා සහභාගි විය.

ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ, විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් තම සේවා කාලය සම්පූර්ණ කළ පී. එම්. ජයරාජන් මහතා විසින් 1960 නොවැම්බර් 1 වැනි දින සිට අධිපතිවරුන්ගේ සහකාර වශයෙන් වැඩ භාර ගන්නා ලදී.

ආචාර්ය මයිකල් ග්‍රීන්බර්ග් ආර්ථික පයෙර්ෂණ අධ්‍යක්ෂ වශයෙන් තම සේවා කාලය 1960 ජූලි 30 වැනි දින නිමා කළේය. ක්‍රම සම්පාදක ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ වූ ද, ක්‍රම සම්පාදක මණ්ඩලයේ ලේකම් වූ ද ආචාර්ය ගාමිණී කොරෙයා 1960 ඔක්තෝබර් 1 වැනි දින නැවත මහ බැංකුවට පැමිණියේ, 1960 ඔක්තෝබර් 5 වැනි දින සිට වැඩ බලන ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් වැඩ භාර ගත්තේය.